431

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

RICHMOND COLLEGE LIBRARY
GALLE

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය 2019

## 8 ශ්‍රේණිය
## පුරවැසි අධ්‍යාපනය

නම/විභාග අංකය :-- ........................................................................ කාලය : පැය දෙකයි.

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

- අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවල නිවැරදි පිළිතුරු තෝරා යටින් ඉරක් අඳින්න.

01. නිදහස් අධ්‍යාපනය ශ්‍රී ලංකාවට හඳුන්වා දීමේ ගෞරවය හිමිවන්නේ,

    (1) ලලිත් ඇතුලත්මුදලි මහතාට

    (2) සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර මහතාට

    (3) සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණියට

    (4) ඩී. බී. විජේතුංග මහතාට

02. ශ්‍රී ලංකාව, මැලේරියාව දුරුකළ රටක් බවට ප්‍රකාශ කරන ලද ජාත්‍යන්තර සංවිධානය වන්නේ,

    (1) යුනිසෙෆ් සංවිධානය (2) නේටෝ සංවිධානය

    (3) ලෝක සෞඛ්‍ය සංවිධානය (4) ඔපෙක් සංවිධානය

03. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින් පාසල් සිසුන් සඳහා ක්‍රියාත්මක කර ඇති විශේෂ සේවය,

    (1) සිසු සැරිය (2) මඟනැගුම

    (3) ගැමි සැරිය (4) සුවසැරිය

04. අපරාධ පිළිබඳ මූලික විමර්ශන කටයුතු කිරීම කාර්යයක් වන ආයතනය වන්නේ,

    (1) පාබල හමුදාව (2) පොලිසිය

    (3) ගුවන් හමුදාව (4) විශේෂ කාර්ය බලකාය

05. පොදු දේපළ අයුතු ලෙස පරිහරණය කිරීම කවර නායකත්ව ශෛලියක ලක්ෂණයක් ද?

    (1) නාමික නායකත්ව ශෛලිය

    (2) ප්‍රජාතන්ත්‍රවාදී නායකත්ව ශෛලිය

    (3) ඒකාධිපති නායකත්ව ශෛලිය

    (4) දූෂිත නායකත්ව ශෛලිය

- 06 සිට 10 දක්වා දී ඇති ප්‍රකාශ නිවැරදි නම් ''නි'' යන්න වටා ද, වැරදි නම් ''වැ'' යන්න වටා ද රවුමක් අඳින්න.

06. මධ්‍යම පරිසර අධිකාරිය පරිසරය සංරක්ෂණය සඳහා රජය මඟින් පිහිටුවා ඇති ආයතනයකි. ( නි / වැ )

07. මිතුරු සබඳතා පැවැත්වීමට ඇති නිදහස ළමා අයිතිවාසිකමක් නොවේ. ( නි / වැ )

08. නිවර්තන කලාපය තුළ වේගවත්ව හටගන්නා ප්‍රචණ්ඩකාරී සුළං සුනාමි නමින් හඳුන්වයි. ( නි / වැ )

09. ආදරය හා රැකවරණය නොඅඩුව ලැබීම පවුල තුළ දැකිය හැකි ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණයකි. ( නි / වැ )

10. ''එකා සැමටත් - සැම එකාටත්'' යන්න යුධ හමුදාවේ ආදර්ශ පාඨයයි. ( නි / වැ )

- 11 සිට 15 දක්වා දී ඇති ප්‍රශ්නවල හිස්තැනට සුදුසු පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.

11. ප්‍රතිශක්තිකරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ........................................ සේවය මඟින් ඉටුකරන කාර්යයකි.

12. නීතිවිරෝධී මධ්‍යසාර හා මත්ද්‍රව්‍ය මැඩලීම ........................................ යෙන් සිදුවන සේවයකි.

13. ශ්‍රී ලංකාවේ ප්‍රධාන සංස්කෘතීන් හැඩගැසී ඇත්තේ ........................................ මුල් කරගෙනයි.

14. ........................................ උත්සවය, ඉස්ලාම් බැතිමතුන් විසින් පවත්වනු ලබයි.

15. ලෝකයේ බොහෝ රටවල ........................................ සමාජ දැකිය හැකිය.

(බහු සංස්කෘතික, ගුවන් හමුදාව, රාමසාන්, ප්‍රවාහන, සෞඛ්‍යය, තෛපොංගල්, පොලිසිය, අධ්‍යාපනය, ආගම)

- 16 සිට 20 දක්වා ප්‍රශ්නවල නිවැරදි පිළිතුර තිත් ඉර මත ලියන්න.

16. ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය දිවයිනේ බොහෝ ප්‍රදේශවලට ........................................ ජලය සපයයි.

17. නව දැනුම ලබාදීම ........................................ මඟින් ඉටුකරන කාර්යභාරයකි.

18. ලොව දක්නට ලැබෙන ප්‍රබලතම බහු සංස්කෘතික සමාජයක් සහිත රටවල් අතරින් ........................................ සුවිශේෂී වේ.

19. එකිනෙකා අතර අවබෝධය ඇතිවී විශ්වාසයෙන් යුතුව කටයුතු කිරීම නිසා ........................................ අවම වේ.

20. සමාජයක් මෙහෙයවන ප්‍රධාන බලවේගය ........................................

(20 × 2 = ලකුණු 40)

## II කොටස

- **පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**
- **පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.**

(01) (1) අප ප්‍රයෝජනයට ගන්නා පොදු සේවා දෙකක් නම් කරන්න.

(2) බ්‍රිතාන්‍ය පාලන යුගයේ ආරම්භ කළ පොදු සේවා දෙකක් ලියන්න.

(3) මිනිසා තුළ ඇතිවිය හැකි චිත්තවේග දෙකක් ලියන්න.

(4) මනස සන්සුන් කිරීමේ අභ්‍යාස දෙකක් ලියන්න.

(5) ක්‍රිස්තියානි/ කතෝලික භක්තිකයන් විසින් පවත්වනු ලබන ප්‍රධාන ආගමික උත්සව දෙකක් නම් කරන්න.

(6) බහු සංස්කෘතික සමාජ පවතින රටවලට නිදසුන් දෙකක් දෙන්න.

(7) ඔබට නවතම මාතෘකා යටතේ පුවත් දැනගැනීමට භාවිත කළ හැකි මුද්‍රිත මාධ්‍ය දෙකක් ලියන්න.

(8) ලෝකයට මිල කළ නොහැකි සේවයක් කළ ශ්‍රේෂ්ඨ ආගමික නායකයන් දෙදෙනකු නම් කරන්න.

(ලකුණු 2 × 8 = 16)

(02) (1) සමුපකාරයේ ආදර්ශ පාඨය ලියන්න. (ලකුණු 02)

(2) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන සමුපකාර සමිති වර්ග තුනක් ලියන්න. (ලකුණු 03)

(3) පොදු සේවා සපයන ආයතන පහක් නම් කර එම ආයතන විසින් සපයන සේවය බැගින් ලියන්න. (ලකුණු 05)

(03) (1) පවුලේ ස්වභාවය අනුව බෙදිය හැකි වර්ග දෙක නම් කරන්න. (ලකුණු 02)

(2) පවුල තුළ දැකිය හැකි ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ තුනක් ලියන්න. (ලකුණු 03)

(3) ප්‍රජාතන්ත්‍රවාදී ජීවන ක්‍රමයක් හුරු කිරීම සඳහා පාසල ක්‍රියාත්මක කරන විෂය සමගාමී ක්‍රියාකාරකම් තුනක් සඳහන් කරන්න.
එම ක්‍රියාකාරකම්වලට සහභාගි වීමෙන් ඔබට ලබාගත හැකි ප්‍රයෝජන දෙකක් ලියන්න. (ලකුණු 05)

(04) (1) ළමයින් ලෙස පිළිගැනෙන්නේ කවර වයස් මට්ටමේ පුද්ගලයන් ද? (ලකුණු 02)

(2) ළමා අයිතිවාසිකම් දක්වා ඇති තේමා හතරෙන් තුනක් නම් කරන්න. (ලකුණු 03)

(3) සමාජය තුළ දැකිය හැකි නායකත්ව ශෛලීන් තුනක් ලියා ඉන් එකක් තුළ දැකිය හැකි ලක්ෂණ දෙකක් සඳහන් කරන්න. (ලකුණු 05)

(05) (1) ''ආපදා කළමනාකරණය'' යන්න කෙටියෙන් නිර්වචනය කරන්න. (ලකුණු 02)

(2) අනතුරු සිදුවිය හැකි ස්ථාන 06ක් නම් කරන්න. (ලකුණු 03)

(3) ආහාර විෂවීම නිසා මිනිසුන් මිය ගිය අවස්ථා දෙකක් සඳහන් කර එවැනි අනතුරු වළක්වා ගැනීමට අපට කළ හැකි දේ කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(06) (1) අපේ රටේ ආගම පදනම් කොටගෙන ගොඩනැඟී ඇති සංස්කෘතීන් දෙකක් ලියන්න. (ලකුණු 02)

(2) බහු සංස්කෘතික රටක් වශයෙන් ඇමරිකා එක්සත් ජනපදය බහු සංස්කෘතික බව ආරක්ෂා කර ගැනීම සඳහා අනුගමනය කර ඇති ක්‍රියාමාර්ග තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(3) ජාතික සමඟිය හා තිරසාර සාමය ගොඩනඟා ගැනීමේ වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(07) (1) පාසල තුළ දකිය හැකි නායකයකු සහ එම නායකයාගේ අනුගාමිකයන් සඳහන් කරන්න. (ලකුණු 02)

(2) ප්‍රජාතන්ත්‍රවාදී දිවි පැවැත්මට අදාළ ගුණාංග තුනක් ලියන්න. (ලකුණු 03)

(3) ප්‍රජාතන්ත්‍රවාදී ජීවන රටාව තුළින් නීති ගරුක සමාජයක් බිහිවන්නේ කෙසේද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)